" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599<br>ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601<br>ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk | පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone | 011 - 2093000 |
|---|---|---|---|


SLSI ISO 9001 SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/05-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.05.30 |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ අංක 06/2022

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**පවතින සම්පත් හිඟය මත රාජ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල කාර්ය මණ්ඩල කැඳවීම සීමා කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන ලේකම් විසින් 2022.05.25 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2022 හා බැඳේ.

02. මේ සම්බන්ධයෙන් 2022.05.27 දින ගරු ආණ්ඩුකාරතුමා සමග පැවැති සාකච්ඡාවේදි ලබා දුන් උපදෙස් පරිදි මෙම දුෂ්කර කාල සීමාව ඉන්ධන, විදුලිය, ජලය සඳහා වන වියදම් අවම වන ලෙස හා මහජනතාවට ඉටුවන සේවාවන් වලට බාධාවක් නොවන ලෙස පහත සඳහන් පරිදි 2022.06.01 දින සිට නැවත උපදෙස් ලබා දෙනතුරු කටයුතු කල යුතුය.

- බස්නාහිර පළාතේ ආදායම් උත්පාදනය කරනු ලබන ආයතන වල නිලධාරීන් අදාල රාජකාරී වලට හා ආදායම් ඉලක්කවලට අනුව ආදායම් උත්පාදනයට බාධාවක් නොවන ලෙස සුදුසු සේවා මුර ක්‍රමයක් සකස් කර ගැනීම ආයතන ප්‍රධානියා විසින් කටයුතු කල යුතුය.
- බස්නාහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් සියළුම කාර්ය මණ්ඩල සේවයට කැඳවීමේදී පළාත් රෝහලේ / ආයතනයේ රෝගී සත්කාරක සේවය ඇතුළු සෞඛ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාමට කිසිදු බාධාවක් නොවන අයුරින් සහ ප්‍රවාහන අපහසුතා මග හරවා ගන්නා පරිදි සුදුසු සේවා මුර ක්‍රමයකට යටත්ව අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩල සේවයට කැඳවීමට ආයතන ප්‍රධානීන් කටයුතු කල යුතුය.
- බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ යටිතල පහසුකම් සපයා ඇති ආකාරය හා නිලධාරීන්ට සේවයට වාර්තා කිරීම සඳහා සපයා ඇති ප්‍රවාහන පහසුකම් අනුව සේවා මුර ක්‍රමයට අත්‍යාවශ්‍ය අවම නිලධරයින් කැඳවීම වියදම් අවම කර ගැනීම සඳහා යෝග්‍ය විසඳුමක් නොවන බැවින් බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ සියළුම කාර්ය මණ්ඩල සඳහා සතියේ සිකුරාදා දින නිවාඩු ලබා දෙනු ලැබේ.එහෙත් තම අමාත්‍යාංශයේ / ආයතනයේ සේවා ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන්ගේ සේවා සැපයීම සඳහා මෙම ගොඩනැගිල්ලේ බිම් මහල් පරිශ්‍රය තුල සුදුසු නිලධාරියෙකු රඳවා අවශ්‍ය කටයුතු කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන ලෙස දන්වමි.

- බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලෙන් පිටත පිහිටා ඇති බස්නාහිර පළාතේ අනෙකුත් ආයතන / දෙපාර්තමේන්තු සඳුදා දින සියළුම කාර්ය මණ්ඩල සේවයට වාර්තා කල යුතු අතර මහජන සේවාවන් සැපයීමට බාධාවක් නොවන අයුරින් සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාමට සහ ප්‍රවාහන අපහසුතා මග හරවා ගන්නා පරිදි සුදුසු සේවා මුර ක්‍රමයකට යටත්ව අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩල සේවයට කැඳවීමට ආයතන ප්‍රධානීන් කටයුතු කල යුතු බව කාරුණිකව දන්වමි.

03. මෙහිදී රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සම්බන්ධයෙන් නිකුත් කල 2022.03.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2022 කෙරෙහි ද අවධානය යොමු කර කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

olc
05/30